# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1644/26 - 2010 මාර්තු 11 වැනි බ්‍රහස්පතින්දා - 2010.03.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**විනිමය පාලන පනත යටතේ දැන්වීම**

( ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥප්තිය සංග්‍රහයේ 423 වැනි පරිච්ඡේදය)

**ශ්‍රී ලංකාවෙන් පිටත බැංකුවල ගිණුම් විවෘත කිරීම සහ පවත්වා ගැනීමට අවසරය**

විනිමය පාලන පනතේ 48 වැනි වගන්තිය සමග කියැවෙන 6AA වගන්තිය සහ 8 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ ශ්‍රී ලංකාව තුළ සිටින හෝ ශ්‍රී ලංකාව තුළ නේවාසිකව සිටින පුද්ගලයින්ට සහ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගම් හෝ ආයතනවලට ශ්‍රී ලංකාවෙන් පිටත විදේශ මුදලින් ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීමට හෝ එම ගිණුම් වසා දැමීමට පහත දැක්වෙන පරිදි මෙයින් පොදු අවසරය ප්‍රදානය කරනු ලැබේ.

*ගිණුම් විවෘත කිරීමට හා පවත්වාගෙන යාමට අවසරලත් පුද්ගලයින්*

1. (i) ව්‍යාපාර, අධ්‍යයන හෝ වෛද්‍ය ප්‍රතිකාර කටයුතු සඳහා තාවකාලිකව ශ්‍රී ලංකාවෙන් පිටතට ගමන් කළ ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙකු ;

   (ii) ශ්‍රී ලංකාවේ නේවාසිකයෙකුව සිටිමින් ශ්‍රී ලංකාවෙන් පිටතට වෘත්තීමය සේවාවන් සපයන පුද්ගලයෙකු හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගමක් හෝ ආයතනයක් ;

   (iii) ශ්‍රී ලංකාවෙන් පිටත ආයෝජනය කිරීම සඳහා ගරු මුදල් අමාත්‍යතුමා විසින් අවසර ලබා දුන් පුද්ගලයෙකු හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගමක් හෝ ආයතනයක් ;

   (iv) විදේශ මුදලින් එතෙර දී ණය දීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර ලබා දුන් පුද්ගලයෙකු හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගමක් හෝ ආයතනයක් ; සහ

   (v) වෙළෙඳ භාණ්ඩ අපනයනකරුවෙක්.

*ගිණුම් සඳහා බැර*

2. විනිමය පාලන පනතේ වගන්ති ප්‍රකාරව හෝ පනත යටතේ සැකසූ හෝ නිකුත් කරන ලද රෙගුලාසි, නිවේදන හෝ විධානයන්ට අනුකූලව, ශ්‍රී ලංකාවෙන් පිටත දී නීත්‍යානුකූලව ලැබූ හෝ අත්පත් කරගත් විදේශීය මුදල් හෝ ගිණුම් හිමියාගේ අනුමත විදේශ විනිමය ගනුදෙනුවක් වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ දී බලයලත් වෙළෙඳුන්ගෙන් හෝ බලයලත් පුද්ගලයන්ගෙන් ලබාගන්නා ලද විදේශීය මුදල් මෙම ගිණුමට බැර කළ හැක.

1A - G 12597— 350 (2010/03)

*ගිණුම් සඳහා හර*

3. විනිමය පාලන පනතේ වගන්ති ප්‍රකාරව හෝ පනත යටතේ සැකසූ හෝ නිකුත් කරන ලද රෙගුලාසි, නිවේදන හෝ විධානයන්ට අනුකූලව, ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයින් සඳහා අනුමත, ගිණුම් හිමියාගේ ඕනෑ ම විදේශ විනිමය ගනුදෙනුවක් වෙනුවෙන් මෙම ගිණුමේ අරමුදල් ප්‍රයෝජනයට ගත හැක.

*ගිණුම් වසා දැමීම*

4. මෙම නිවේදනයේ අවසරයට අනුකූලව එතෙර බැංකුවක ආරම්භ කොට පවත්වාගෙන ගිය ගිණුමක් වසා දැමුවේ නම් එම වසා දැමීමේ සිට මාසයක් ඇතුළත ගිණුමේ ශේෂය බැංකු ක්‍රමය හරහා ශ්‍රී ලංකාවට මව්හිමායනය කළ යුතු ය.

5. මෙම නිවේදනයෙහි පෙළ යෙදුම අනුව අන් ලෙසකින් අවශ්‍ය නොවන්නේ නම් —

(අ) " බලයලත් ගනුදෙනුකරු " යන්නෙන් විනිමය පාලන පනතේ 4 වැනි වගන්තිය යටතේ එම පනතේ කාර්යයන් සඳහා තත්කාලය තුළ රන් හෝ ඕනෑම විදේශීය මුදල් වර්ගයක් සම්බන්ධයෙන් බලයලත් ගනුදෙනුකරුවෙකු වශයෙන් බලය දෙනු ලැබූ වාණිජ බැංකුවක් අදහස් කෙරේ ;

(ආ) " බලයලත් තැනැත්තා " යන්නෙන් තත්කාලය තුළ විනිමය පාලන පනතේ 5 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලය දෙනු ලැබූ ඕනෑ ම තැනැත්තෙකු අදහස් කෙරේ ;

(ඇ) " විදේශීය මුදල් " යන්නට විනිමය පාලන පනතේ දී ඇති අර්ථය ම අදාල වේ ;

(ඈ) " මුදල් " යන්නට විනිමය පාලන පනතේ දී ඇති අර්ථය ම අදාල වේ ;

(ඉ) "ශ්‍රී ලංකාවේ පදිංචි තැනැත්තෙකු " හෝ "ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි තැනැත්තෙකු " යන්නට විනිමය පාලන පනතේ 37(1) වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලදුව 1972 අප්‍රේල් මස 21 වැනි දිනැති අංක 15007 දරන *රජයේ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද නියමයෙන් දක්වා ඇති අර්ථය ම දැක්වේ.

පී. එච්. ඕ. චන්ද්‍රවංශ,
විනිමය පාලක.

2010 මාර්තු මස 11 වැනි දින,
කොළඹ,
ශ්‍රී ලංකා මහ බැංකුව,
විනිමය පාලන දෙපාර්තමේන්තුවේ දී ය.

03-895

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.